**ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දූත මණ්ඩලයේ ශ්‍රී ලංකා සංචාරය නිමා වේ.**

**2016 අප්‍රේල් 11 දින**

රටක සංචාරය අවසන් කිරීමෙන් පසු නිකුත් කරනු ලබන පුවත්පත් නිවේදනයන්හි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ.අරමුදලේ) දූත මණ්ඩලයේ මූලික නිරීක්ෂණයන් ඇතුළත් වේ. මෙම ප්‍රකාශනයේ ඇති අදහස් ජා.මූ.අරමුදලේ දූත කණ්ඩායමේ මතය වන අතර එමගින් අවශ්‍යයෙන්ම ජා.මූ.අරමුදලේ කළමනාකාරිත්වයේ හෝ විධායක මණ්ඩලයේ මතය පිළිබිඹු නොකෙරෙයි. දූත මණ්ඩලයේ මූලික නිරීක්ෂණ පදනම් කරගෙන කළමනාකාරිත්වයේ අනුමැතියට යටත්ව ජා.මූ.අරමුදලේ නිලධාරීන් වාර්තාවක් පිළියෙළ කරන අතර එය ජා.මූ.අරමුදලේ විධායක මණ්ඩලයේ සාකච්ඡා කිරීමටත්, තීරණ ගැනීම සඳහාත් ඉදිරිපත් කෙරෙයි.

ටොඩ් ෂ්නයිඩර් (Tod Schneider) මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් ජා.මූ.අරමුදලේ දූත පිරිසක් මාර්තු මස 31 වැනි දින සිට අප්‍රේල් මස 11 වැනි දින දක්වා කාලය තුළ දී උපදේශන සාකච්ඡා (2016 Article IV) සහ බලධාරීන්ගේ ඉල්ලීම පරිදි අරමුදල් සහයෝගිතා වැඩසටහන පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා කොළඹට පැමිණියේය. විස්තීර්ණ ණය පහසුකම යටතේ මාස 36 ක කාල පරාසයක් පුරා දිවෙන ආර්ථික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම පිණිස රජයත් දූත පිරිසත් අතර නිලධාරී මට්ටමේ වන එකඟතාවයෙහි සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගත්තේය. ජා.මූ.අරමුදලේ කළමනාකාරීත්වය සහ විධායක මණ්ඩල අනුමැතියට යටත්ව, නිලධාරී මට්ටමේ එකඟතා අවසන් මට්ටමකට ගෙන ඒමේ අරමුණින් ඉදිරි සති දෙක තුළ දී ජා.මූ.අරමුදලේ සහ ලෝක බැංකුවේ වසන්ත ඍතුවේ රැස්වීම්වලට සමගාමීව, වොෂින්ටනයේ දී මෙම වැඩසටහන පිළිබඳ සාකච්ඡා, බලධාරීන් සමඟ අඛණ්ඩව පැවැත්වෙනු ඇත.

මෙම සංචාරය අවසානයේ දී ෂ්නයිඩර් මහතා විසින් පහත සඳහන් ප්‍රකාශය නිකුත් කරන ලදී.

"2015 වසරේ සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය තුළින් ආර්ථිකයේ ධනාත්මක වර්ධනය ප්‍රවණතාව, දේශීය ප්‍රතිපත්තිවල බලපෑම සහ විදේශීය ආර්ථික පසුබිම අභියෝගාත්මක වීම වැනි තත්ත්වයන්හි සම්මිශ්‍රණයක් පෙන්නුම් කළේය. රාජ්‍ය මූල්‍ය හිඟය පුළුල් වීම, රාජ්‍ය ණය ඉහළ යෑම මෙන්ම වෙළඳ මිල අනුපාතය වර්ධනය වීම හමුවේ වුව ද ගෙවුම් තුලන තත්ත්වය පහළ යෑමක් දැකිය හැකි විය. 2016 වසරේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය සියයට 5 ක මට්ටමේ සහ උද්ධමනය අඩු තනි අගයක පවතිනු ඇතැයි ද අපේක්ෂා කෙරෙයි. මැදිකාලීන වශයෙන්, ආර්ථික වර්ධනය ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත විභව නිමැවුම් මට්ටමට ළඟා වීමට හැකියාවක් පවතින නමුත්, නුදුරු අනාගතයේදී ගනු ලබන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ වෙළඳාම සහ ආයෝජන කෙරෙහි පවතින අවහිරතා ඉවත් කිරීම මත මෙහි සාර්ථකභාවය රඳා පවතිනු ඇත.

"ඉහළ සහ තිරසාර ආර්ථික වර්ධන මට්ටමක් ළඟාකර ගැනීම, සාර්ව ආර්ථික සහ මූල්‍ය ප්‍රතිපත්තීන් නිසි ආකාරයෙන් ස්ථාපිත කිරීම සහ රාජ්‍ය මූල්‍ය සහ විදේශීය සංචිත වඩා හිතකර මට්ටමකට ගොඩනැගීම අරමුණු කර ගනිමින් ආර්ථික වැඩසටහනක් බලධාරීන් විසින් යෝජනා කර ඇත. ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය තුළ අන්තර්ගත ප්‍රධාන අරමුණු අතර (i) බදු පරිපාලනය සහ බදු ප්‍රතිපත්තිය වැඩිදියුණු කිරීම; (ii) රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීම; (iii) රජය සතු ආයතන ප්‍රතිසංස්කරණය; සහ (iv) වඩා ඉහළ ඉදිරි දැක්මක් සහිත ආර්ථිකයක් ඇති කිරීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කිරීම, විදේශ විනිමය වෙළඳපොළ පුළුල් කිරීම සහ මූල්‍ය අංශයේ අධීක්ෂණය ශක්තිමත් කිරීම අන්තර්ගත වේ.

"ආර්ථික වර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් රජයේ ආදායම වැඩි කිරීම මත රාජ්‍ය මූල්‍ය සහ රාජ්‍ය ණය සැලකිය යුතු ලෙස අඩු කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය තුළ ප්‍රමුඛස්ථානය හිමිවේ. මේ අනුව බලනකල 2016 වසරේ රාජ්‍ය අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 5.4 ක් දක්වා අඩු කිරීමට ගත් අමාත්‍ය මණ්ඩල තීරණය දූත මණ්ඩලය අගය කරනු ලබන අතර අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ බදු සහ වියදම පිළිබඳ වූ ප්‍රතිපත්ති තීරණ ඉතා ඉක්මණින් ක්‍රියාත්මක කිරීමට උපෙදස් දෙයි. රාජ්‍ය ව්‍යවසායයන්ගේ නොපියවා

ඇති වගකීම් හඳුනා ගැනීම සහ නිසි විසඳුම් සෙවීම සඳහා පැහැදිලි උපායමාර්ගයක් අනුගමනය කිරීම, බදු නිදහස් කිරීම් අඩුකර බදු පදනම පුළුල් කිරීමට කටයුතු කිරීම සහ නව ආදායම් බදු පනතක් හඳුන්වා දීම, කෙටිකාලීනව ගත යුතු අනෙකුත් ක්‍රියාමාර්ගවලට ඇතුළත් වේ. ආදායම් පරිපාලනය නවීකරණය කිරීම සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය (RAMIS, ITMIS සහ ASYCUDA++ වැනි දැනටමත් ආරම්භ කර ඇති ප්‍රධාන පරිගණක පද්ධති ක්‍රියාත්මක කිරීම ඇතුළුව) තුළින් බදු ප්‍රතිපත්ති සහ වියදම් ප්‍රතිපත්ති තවදුරටත් ප්‍රතිසංස්කරණය කිරීම මත මැදිකාලීන ආදායම් ඉහළ දැමීමේ ප්‍රයත්නය පදනම් වනු ඇත.

"මූලික උද්ධමනය අඛණ්ඩව ඉහළ යෑම සහ පෞද්ගලික අංශයේ ණය වර්ධනය වීම හමුවේ මෑත කාලීනව මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම, දූත පිරිසේ ඇගයීමට ලක් විය. කෙසේ නමුත්, මුදල් ප්‍රතිපත්ති යාන්ත්‍රණය දිගු කාල පමාවක් සහිතව ක්‍රියාත්මක වීම සහ මූලික උද්ධමනය හා පෞද්ගලික අංශයේ ණය වර්ධනය ඉහළ යෑමෙහි ප්‍රවණතාව අඛණ්ඩව පැවතුණහොත් මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් දැඩි කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සූදානමින් සිටිය යුතු වේ. ණය නොවන මූලාශ්‍ර මගින් සංචිත මට්ටම ගොඩනැගීම සඳහා සක්‍රීයව පියවර ගන්නා ලෙස ද දූත මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවට නිර්දේශ කරනු ලබයි.

"මූල්‍ය පද්ධතිය මනා ලෙස ප්‍රාග්ධනීකරණය සහ ද්‍රවශීලීව තිබුණ ද, අක්‍රිය ණය ප්‍රමාණය ඉහළ යෑමට ඇති ඉඩප්‍රස්ථාව පිළිබඳ අවදානම කෙරෙහි බලධාරීන් අවධානයෙන් සිටිය යුතුය. ඒකාබද්ධ පදනම මත අධීක්ෂණයට හා බාසල් III නියාමන රාමුව භාවිත කිරීමට ගත් පියවර දූත පිරිසේ ඇගයීමට ලක් වූ අතර, අර්බුද සඳහා වූ පෙර සූදානම හා නිශ්චය කිරීම පිළිබඳ නීතිමය රාමුවක් ශක්තිමත් කිරීම සඳහා අඛණ්ඩ ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ එකඟතාවයකට එළැඹිණි.

"මැදිකාලීන ආර්ථික වර්ධනය සහ සංචිත අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී සහ බාහිර අවදානම්වලට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නංවා ගැනීමේ දී, කලාපීය සහ ගෝලීය සැපයුම් ජාලයට වඩාත් ඉහළ ලෙස සම්බන්ධ වීම, විදේශීය ඍජු ආයෝජන වැඩි කර ගැනීම සහ පෞද්ගලික අංශයට ආයෝජන අවස්ථා ඉහළ නැංවීම සඳහා නව ප්‍රයත්නයක් දැරීමට අවශ්‍ය වනු ඇත. වෙළඳාම ඉහළ නැංවීමට සහ පෞද්ගලික අංශය සංවර්ධනය කිරීමට තීරුබදු සහ තීරුබදු නොවන වෙනත් බදු සමාලෝචනය

කිරීමෙන් ආරක්ෂණ ක්‍රමවේදය වෙත අවධානය යොමු කිරීමට දූත මණ්ඩලය නිර්දේශ කරයි. යුරෝපීය සංගමයෙන් මත්ස්‍ය ආනයන වාරණය කිරීම ලිහිල් කිරීම සහ විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වාරණයන් පිළිබඳ පොදු ක්‍රමය නැවත ස්ථාපිත කිරීම ඇතුළුව දැනට තරගකාරිත්වය ඉහළ නැංවීමට ගෙන ඇති අනෙකුත් ක්‍රියාමාර්ග දූත පිරිසෙහි ඇගයීමට ලක් විය. අන්තර්ජාතික වෙළඳාම වෙනුවෙන් පහසුකම් සැලසීමේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම (ඉලෙක්ට්‍රොනික රේගු ලියකියවිලි ක්‍රමය සම්පූර්ණයෙන් ක්‍රියාවට නැංවීම ද ඇතුළත් ව), විදේශීය ආයෝජන ලබා ගැනීම සහ රඳවා ගැනීමට ඇති බාධක ඉවත් කිරීම, මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ අවස්ථාවන් වැඩි කිරීම සහ මූල්‍ය වෙළඳපොළ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.

"දූත පිරිස අග්‍රාමාත්‍ය වික්‍රමසිංහ, මුදල් අමාත්‍ය කරුණානායක, සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් පිළිබඳ අමාත්‍ය සමරවික්‍රම, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති මහේන්ද්‍රන්, අනෙකුත් රාජ්‍ය නිලධාරීන් සහ ව්‍යාපාරික ප්‍රජාව, සමාජ නියෝජනයන් සහ අන්තර්ජාතික හවුල්කරුවන්ගේ නියෝජිතයින් මුණ ගැසුණේය."